මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/91** **2024.09.18**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### 2024.08.15 දින සිට 2024.09.18 දින ප.ව.04.30 දක්වා කාලය තුළ සමාජ මාධ්‍ය හා සම්බන්ධ මැතිවරණ පැමිණිලි

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් සමාජ මාධ්‍යවල පළ වන පුවත්, සටහන්, ප්‍රතිචාර, ඡායාරූප සහ වීඩියෝ සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වකරුවන් විසින් යොමු කරන ලද පැමිණිලිවලට අදාළ සබැඳීන් නිරීක්ෂණය සහ නියාමනය කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව, ලැබුණු පැමිණිලි සමාලෝචනය කර 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරග වදින පක්ෂ/ අපේක්ෂකයින්ගේ අගතියට හේතුවන සහ නීතිවිරෝධී ප්‍රවර්ධන සහිත සබැඳීන් ඉවත් කරන ලෙස දන්වා අදාළ සමාජ මාධ්‍ය ආයතන වන මෙටා, යූටියුබ්, ටික්ටොක් සහ ගූගල් ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී. සමාජ මාධ්‍ය ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි හා සම්බන්ධ සමස්ත සබැඳීන් සංඛ්‍යාව **802** ක් වන අතර, මෙ දක්වා එකී සබැඳීන්වල සාරාංශය පහත පරිදි වේ.

| සමාජ මාධ්‍ය ආයතන විසින් සාර්ථකව ඉවත් කරන ලද සබැඳීන් සංඛ්‍යාව | සමාජ මාධ්‍ය ආයතන විසින් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද සබැඳීන් සංඛ්‍යාව | අදාළ ආයතන වෙතින් පසුවිපරම් පණිවිඩ ලැබීමට නියමිත සබැඳීන් සංඛ්‍යාව |
|---|---|---|
| 121 | 116 | 565 |

මෙම සියලුම සබැඳීන් පහත වර්ගීකරණය යටතේ හඳුනා ගනිමින් වාර්තා කිරීම සිදු කර ඇත.

| වෛරී ප්‍රකාශ | දුස්තොරතුරු | ප්‍රචාරණ කටයුතු සඳහා ළමුන් යොදා ගැනීම | වැරදි පුවත් | 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ සඳහන් ප්‍රතිපාදනවලට පටහැනි අන්තර්ගත කරුණු |
|---|---|---|---|---|
| 247 | 309 | 13 | 174 | 59 |

2024.09.18 වන දින මධ්‍යම රාත්‍රී 12.00න් පසු 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාළ සියලුම ප්‍රචාරණ කටයුතු අවසන් වන බැවින්, දේශපාලන පක්ෂ/ අපේක්ෂකයින්, පක්ෂ/ අපේක්ෂකයින්ගේ අනුගාමිකයින් සහ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් විසින් සමාජ මාධ්‍යවල සිදු කරනු ලබන සියලුම ප්‍රචාරණ කටයුතු අත්හිටුවන ලෙස දන්වා සිටිනු ලැබේ. යම් ආකාරයකින් එවැනි ප්‍රචාරණ කටයුත්තක් සමාජ මාධ්‍ය භාවිතා කරමින් සිදු කරන බවට මැතිවරණ කොමිෂන් සභාවට වාර්තා වන්නේ නම්, එකී ප්‍රචාරණවල අන්තර්ගත කරුණු ඉවත් කිරීම සඳහා අදාළ සමාජ මාධ්‍ය ආයතනවලට යොමු කරන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්